සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2024 ජූලි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

2024-08-17
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) ***ප්‍රස්තාර කොළ*** *සපයනු ලැබේ.*
  (7) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (8) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ප්‍රාග්ධනය සඳහා වන ප්‍රතිලාභය කුමක් ද?

(1) ලාභය. (2) වේතන. (3) කුලිය. (4) පොලිය.

**1.2** X සහ Y භාණ්ඩ අතර හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය සෘණ වේ නම්, මෙම භාණ්ඩ වන්නේ:

(1) පොදු භාණ්ඩයි. (2) අනුපූරක භාණ්ඩයි.
(3) සාමාන්‍ය භාණ්ඩයි. (4) ආදේශක භාණ්ඩයි.

**1.3** යම්කිසි තෝරාගත් තීරණයක් වෙනුවෙන් කැපකරන ලද ඊළඟ හොඳම විකල්පයේ වටිනාකම හඳුන්වනු ලබන්නේ:

(1) ආවස්ථික පිරිවැය ලෙසයි. (2) හිඟකම ලෙසයි.
(3) සාමාන්‍ය පිරිවැය ලෙසයි. (4) තේරීම ලෙසයි.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?


(1) ආයතනයට සියලුම නිෂ්පාදන සාධක වෙනස් කළ හැකි වේ.

(2) ස්ථාවර නිෂ්පාදන සාධක නොමැත.

(3) නිෂ්පාදන සාධක, විචල්‍ය සාධක සහ ස්ථාවර සාධක වශයෙන් බෙදා වෙන් කරයි.

(4) ආයතනයට නිෂ්පාදන ධාරිතාවය වැඩිකර ගැනීමට ඉහළ නම්‍යතාවයක් තිබේ.

**1.5** භාණ්ඩයක් සඳහා වන පහත සඳහන් ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර ඔබ වෙත ලබාදී ඇත:




නිෂ්පාදන අතිරික්තය වන්නේ:

(1) රු.25,000/- කි. (2) රු.40,000/- කි. (3) රු.50,000/- කි. (4) රු.80,000/- කි.

**1.6** 2023 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික සමාලෝචනයට අනුව, 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතය වූයේ:

(1) −2.3%. (2) −8.7%. (3) 1.4%. (4) −4.8%.

**1.7** A නිෂ්පාදිතයේ මිල රු.40/- සිට රු.20/- දක්වා අඩුවන විට එම නිෂ්පාදිතයේ ඉල්ලුම් ප්‍රමාණය ඒකක 800 සිට ඒකක 1,200 දක්වා ඉහළ යයි. මෙම නිෂ්පාදිතයේ මිල ඉල්ලුම් නම්‍යතාවය:

(1) අනම්‍ය වේ. (2) නම්‍ය වේ. (3) ඒකීය නම්‍ය වේ. (4) පූර්ණ නම්‍ය වේ.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, ඉල්ලුම් වක්‍රය වමට විතැන්වීමට බලපාන සාධකයක් වන්නේ කුමක් ද?

(1) ආදේශක භාණ්ඩවල මිල අඩුවීම. (2) අනුපූරක භාණ්ඩවල මිල අඩුවීම.

(3) පාරිභෝගික ආදායම වැඩිවීම. (4) පාරිභෝගිකයින් සංඛ්‍යාව වැඩිවීම.

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, ඒකාධිකාරී වෙළෙඳපොළක් (monopolistic market) සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) එහි ඉල්ලුම් වක්‍රය, වමේ සිට දකුණට පහළට බෑවුම් වේ.

(2) එයට මිල තීරණය කිරීමේ බලය තිබේ.

(3) එය කෙටිකාලයේදී ප්‍රමාණික ලාභ පමණක් ලබයි.

(4) වෙළෙඳපොළ තුළ එක් ආයතනයක් පමණක් ක්‍රියාත්මක වීම.

1.10 නිදහස් වෙළෙඳපොළ තුළ, රජය විසින් අවම මිලක් පැනවීම තුළින් ආරක්ෂා කරන්නේ:

(1) තරගකරුවන්ය. (2) අපනයනකරුවන්ය. (3) පාරිභෝගිකයින්ය. (4) නිෂ්පාදකයින්ය.

*අංක 1.11 සහ 1.12 ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින්, නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.11 උද්ධමනය සහ මිල මට්ටම, ................ *[(සූක්ෂම (micro / සාර්ව (macro)]* ආර්ථික විද්‍යාව තුළින් ආවරණය කරනු ලැබේ.

1.12 මුළු උපයෝගිතාවය උපරිම වන විට, ආන්තික උපයෝගීතාවය ................ *(සෘණ / ශුන්‍ය)* වේ.

*අංක 1.13 සහ 1.14 ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.13 නිමැවුම එක් ඒකකයකින් වැඩිකරන විට, මුළු අයභාරයට අළුතෙන් එකතුවන ප්‍රමාණය ආන්තික අයභාරය ලෙස හඳුන්වනු ලැබේ.

1.14 හීනවන පරිමාණාකුල ඵල නීතියේ උපකල්පනයක් වන්නේ විචල්‍ය සාධක යෙදවුම් සමජාතීය නොවන බවයි.

*අංක 1.15 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.15 වෙළෙඳපොළ තුළ රජය මැදිහත් වන ආකාරයන් දෙකක්(02) සඳහන් කරන්න.

1.16 "අවශ්‍යතා" සහ "වුවමනා" අතර වෙනස්කම් දෙකක්(02) සඳහන් කරන්න.

1.17 "ණය ශ්‍රේණිගත කිරීම" (Credit Rating) යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

1.18 කතිපයාධිකාරී වෙළෙඳපොළක (oligopoly market) ලක්ෂණ දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.19 ශ්‍රී ලංකාවේ සිටින මූල්‍ය අතරමැදිකරුවන් සඳහා උදාහරණ දෙකක්(02) සඳහන් කරන්න.

1.20 "තිරසාර සංවර්ධනයේ" (Sustainable Development) සාමාජීය පැතිකඩ දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) ආර්ථික භාණ්ඩවල ලක්ෂණ තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) මිශ්‍ර ආර්ථික ක්‍රමයක් විසින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගනු ලබන්නේ කෙසේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(c) මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම (සෘණ) සම්බන්ධතාවයක් පවතින්නේ ඇයිද යන්නට හේතුවක් **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

(a) භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත සඳහන් ඉල්ලුම් ශ්‍රිතය ($Q_d$) සහ සැපයුම් ශ්‍රිතය ($Q_s$) සලකා බලන්න:

$$Qd = 1{,}200 - 20p$$

$$Qs = -200 + 20p$$

**ඔබ විසින් කළ යුතු දෑ:**

භාණ්ඩයේ වෙළෙඳපොළ සමතුලිත මිල සහ ප්‍රමාණය **ගණනය කරන්න.** (ලකුණු 03)

(b) ඉල්ලුම් මිල නම්‍යතාවය තීරණය කරන සාධක තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(c) පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේදී ලාභ උපරිම කරගන්නේ කෙසේද යන්න ප්‍රස්තාරයක් භාවිතයෙන් **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

(a) මුදලට ඇති ඉල්ලුම සඳහා ඇති චේතනාවන් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) වාණිජ බැංකු සම්බන්ධයෙන් ලාභදායීත්වය සහ ද්‍රවශීලතාවය අතර ඇති සම්බන්ධතාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිත කරනු ලබන ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) සාපේක්ෂ වාසි න්‍යායයේ භාවිත වන උපකල්පන දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) **A** රට සහ **B** රට විසින් **P** සහ **Q** යන නිෂ්පාදිත දෙවර්ගයම නිෂ්පාදනය කරයි. රටවල් දෙකම විසින් එක් ශ්‍රම ඒකකයක් භාවිතයෙන් නිපදවනු ලබන **P** සහ **Q** ඒකක ප්‍රමාණයන් පහත වගුවෙන් පෙන්නුම් කෙරේ:

| නිෂ්පාදිතය / රට | P (ඒකකවලින්) | Q (ඒකකවලින්) |
|---|---|---|
| **A** | 4 | 12 |
| **B** | 21 | 7 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) එක් එක් නිෂ්පාදිතය නිපදවීම සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටට ද යන්න **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(ii) එක් එක් නිෂ්පාදිතය නිපදවීමේදී සාපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටටද යන්න **හඳුනා දක්වන්න** *(ඔබගේ උත්තරය ගණනය කිරීම් සමඟ තහවුරු කරන්න).* (ලකුණු 04)

(c) ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ අහිතකර ප්‍රතිවිපාක අවම කරගැනීමට ගත හැකි පියවරයන් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

(A) ව්‍යාපාර (business) චක්‍රයේ අවධීන් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(B) කිසියම් ආර්ථිකයක වසරක කාලයක් සඳහා ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් දත්ත ඔබ වෙත ලබාදී ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | 1,600 |
| රජයේ පරිභෝජන වියදම | 2,500 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 4,500 |
| තොග වෙනස්වීම් | 2,500 |
| වටිනාකම වෙනස්වීම් | 2,550 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 4,800 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 2,750 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | 1,004 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) වෙළෙඳපොල මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 06)

(b) වෙළෙඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(c) වෙළෙඳපොල මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(C) දළ දේශීය ආදායම [Gross Domestic Income (GDI)] සහ දළ ජාතික ආදායම [Gross National Income (GNI)] අතර ඇති වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(D) ව්‍යාපාර මත රටක ෆිස්කල් ප්‍රතිපත්තිය (fiscal policy) බලපාන ආකාර (impacts) දෙකක්(02) **පැහැදිලි කරන්න.**

(ලකුණු 03)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |